# අප්‍රකාශිත වහරල සෙල්ලිපි කිහිපයක්

කරුණාසේන හෙට්ටිආරච්චි[1], ඩබ්. එම්. ටී. බී.විජේපාල[2]

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගල්කැටියාගම ග්‍රාමනිලධාරී බලප්‍රදේශයේ ගල්කැටියාගම සේලමණ්ඩලාරාම විහාර භූමියෙහි පිහිටි ගල් තලාවක මෙම සෙල්ලිපිය සටහන්ව ඇත. අඩි පහක් පමණ දිග හා අඩි හතරක් පමණ පළලින් යුත් චපසරියක මෙම සෙල්ලිපිය විහිද පවතී. පුද්ගලයන් කිහිප දෙනෙකුට අයත් ලිපි පහක් මෙහි හඳුනාගත හැකි ය. වම් පසින් එකිනෙක යට ලියූ ලිපි තුනක් ද දකුණු පසින් ලිපි දෙකක් ද වශයෙන් එම ලිපි පහ සටහන්ව ඇත. මින් ශිලාලේඛන දෙකක අක්ෂර පාඨවලට සුළු හානි පැමිණ ඇතත් අනෙක්වා සියල්ල කියවාගත හැකි මට්ටමෙහි පවතී. එසේ වුව ද මේවාට අර්ථ දැක්වීම මඳක් අපහසු කරුණක්ව පවතී.

**අරමුණ**

1950 වර්ෂයේදී මෙම සෙල්ලිපි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පිටපත් කර අංක 2122-27 යටතේ ලියාපදිංචි කොට ඇති අතර සී. ඩබ්ලිව් නිකලස් මහතා විසින් ද නාමමාත්‍රික වශයෙන් පමණක් සඳහන් කර ඇතත් මෙම ලිපි පළ කර නොමැත. එබැවින් උක්ත සෙල්ලිපි කියවා ඒවායේ අන්තර්ගත කරුණු අනාවරණය කිරීම ප්‍රමුඛතම අරමුණ වේ.

විශේෂයෙන් මෙම ලිපියේ අන්තර්ගත කරුණු පිළිබඳ නොදන්නා ජනතාව මෙම ලිපිවලින් නිධන් වස්තු ගැන කියවෙන්නේය යන වැරදි අදහසකින් පසුවන බැවින් මේවා කියවා එහි අන්තර්ගත කරුණු ඔවුන්ට වටහා දීම මගින් ලිපියට ආරක්ෂාවක් සලසා දීමට අපේක්ෂා කරන අතර විශේෂයෙන් උගතුන්ගේ අවධානයට යොමු කරවීම ද මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාවේ අරමුණකි.

---

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: Keyas2009@yahoo.com

[2] මධ්‍යම සංස්කෘතික අරමුදල
Email: nuwantikiribandara@gmail.com

## අන්තර්ගතය

ක්‍රි.ව. 5-7 සියවස් අතරට අයත් වන අක්ෂර පාඨවලින් ලියන ලද මෙම සෙල්ලිපිවල "සදෙව වෙහෙරලය" "චදෙව සයමල වහරල" " චිදෙව වහරල" ආදී වශයෙන් යොදන ලද යෙදුම්වලට අනුව මේවා වහරල සම්ප්‍රදායට අයත් ලිපි බව පැහැදිලි වේ. කහපුව, රගම, උපුල දෙරණ යන ගම්වලට අයත් පුද්ගලයින් කීප දෙනෙකු විසින් කරන ලද වහරල මිදවීම් පිළිබඳව මෙම ලිපිවලින් කියවේ. " වහරල මිදවීම්" යන්න සඳහා උගතුන් විසින් විවිධ අර්ථකථන සපයා ඇති අතර මෙතෙක් ඒ සම්බන්ධයෙන් ඒකමතිකත්වයක් නොමැත. එහෙත් මේ ලේඛන අධ්‍යයනයෙන් ලැබෙන ප්‍රතිඵලය අතිමහත් වේ. මේවා සෙල්ලිපි ඉතිහාසයේ සුවිශේෂ ලේඛන විශේෂයක් වශයෙන් හැඳින්විය හැකිය.

ප්‍රමුඛ පදඃ වහරල, චිදෙව වහරල, සයමල වහරල, සෙල්ලිපි, නිධන්
**Title:** Some Unpublished 'Vaharala' Inscriptions
**Keywords:** Vaharala, Inscriptions, Epigraphy, treasures